චක්‍රලේඛ අංක 04/2016

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත,

18/9 වෛමන් පාර,

නල්ලූර්.

2016.07.20

උතුරු පළාතේ සියළුම සමූපකාර ආයතනවල සභාපතිවරුන් වෙත.

**ප්‍රාදේශීය කළමණාකරු තනතුර සඳහා සුදුසුකම් තාවකාලිකව ලිහිල් කිරීම**

ප්‍රාදේශීය කළමණාකරු තනතුරු පිරවීමේදී අභ්‍යන්තරව අයදුම්පත් කැඳවිය යුතුය. අභ්‍යන්තරව සුදුසු අයදුම් පත් නොලැබුණු විට පමණක් බාහිර අයදුම්පත් කැඳවිය යුතුය.

01. බාහිරවද සුදුසු අයදුම් පත් නොලැබුණු විට පමණක් අඩු සුදුසුකම් සහිත එහෙත් හැකියාව ඇති බවට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සෑහීමට පත් වන්නේ නම් ඔහුව පත් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ නිර්දේශය සමග අදාල දිස්ත්‍රික්කයේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් මගින් සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

02. මෙම අයදුම් පත් විශේෂ විධි විධාන යටතේ වර්ෂයක් සඳහා පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

03. සමිති විසින් මාස 06 ක කාලය තුල හෝ අඩුම වශයෙන් වර්ෂයක් ඇතුලත මෙම පුරප්පාඩු පිරවිය යුතුය.

04. මෙසේ පත්වීම් පිරිනමන සේවකයින් වර්ෂයක් සඳහා පුහුණු සේවකයන් වශයෙන් පත් කරන අතර ඔවුන් මාස 06 ක සමූපකාර කණිෂ්ඨ පෙළ පුහුණුව නිම කළ යුතුය.

05. වර්ෂයක පුහුණු කාලයේ ගෙවීම් ප්‍රාදේශීය කළමණාකරු තනතුරට අදාල මූලික ආරම්භක වැටුපට සමාන මුදලක් ගෙවනු ලැබේ.

06. පුහුණුව ආරම්භවීමත් සමග සෙසු නවක සේවකයින් මෙන් ඇප මුදලක් ලබා ගත යුතුය.

07. වසරක පුහුණු කාලය සතුටුදායකව අවසන් කරන ලද අය ස්ථිර කළමණාකරුවන් වශයෙන් පත්කොට ඊලඟ වැටුප් පියවරේ තබනු ලබන අතර තවත් වසර දෙකක පරිවාස කාලයට යටත් කරනු ලැබේ.

08. ප්‍රාදේශීය කළමණාකරුවන් සඳහා වෙළඳාමේ ඉලක්කය අධ්‍යක්ෂණ මණ්ඩලය විසින් හඳුන්වා දී අඛණ්ඩ ඇගයීමට ලක් කල යුතුය.

2016.07.15 දින කොමිෂන් සභාවේ තීරණය අනුව.

අත්සන

P.VAGESHAN
Secretary
Co-operative Employees Commission
Northern Provincial Council

පී. වාකීසන්,

ලේකම්.

පිටපත්: 01. ස.සං.කො. උතුරු පළාත.

02. උතුරු පළාත් දියළුම සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන්.